# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2016 සැප්තැම්බර් මස 20 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය: **( ප්‍ර/vi(1)/16/71 )**

ආ)(i) බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සහ අමාත්‍යාංශ ලේකම්වරු සභාව මඟින් වියදම් දරා 2014 අප්‍රේල්වලින් පසු විදේශ සංචාර සඳහා සහභාගී වී තිබේද?

(ii) එක් එක් අය සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද?

(iii) කුමන රටවල් වෙතද?

(iv) සංචාරයේ නියුතු වූ දින ගණන කීයද?

(v) එමඟින් සභාව ලද ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිද?

(vi) එක් එක් සංචාරය සඳහා දැරූ වියදම කොපමණද?

(vii) කුමන වැය ශීර්ෂය යටතේද?

(viii) සංචාර සඳහා ඉහත සඳහන් ප්‍රධානීන්ට අමතරව සහභාගී වූ අය කවුරුන්ද? ඒ සඳහා තෝරා ගත් පදනම සහ දැරූ වියදම කොපමණද?

ආ)(i) ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු වර්තමාන අමාත්‍ය මණ්ඩලය පළාත් සභාව මඟින් වියදම් දරා විදේශ සංචාර සඳහා සහභාගී වී තිබේද?

(ii) එක් එක් අය සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද?

(iii) කුමන රටවල් වෙතද?

(iv) සංචාරයේ නියුතු වූ දින ගණන කීයද?

(v) එමඟින් සභාව ලද ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිද?

(vi) එක් එක් සංචාරය සඳහා දැරූ වියදම කොපමණද?

(vii) කුමන වැය ශීර්ෂය යටතේද?

(viii) සංචාර සඳහා ඉහත සඳහන් ප්‍රධානීන්ට අමතරව සහභාගී වූ අය කවුරුන්ද? ඒ සඳහා තෝරා ගත් පදනම සහ දැරූ වියදම කොපමණද?

2. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය:

( ප්‍ර/vi(1)/16/72 )

**(අ)** (i) වර්ෂ 2009 සිට 2016 ජුනි දක්වා කාලය තුළ වසා දැමූ සහ පාඩු ලැබූ සමූපකාර ප්‍රාදේශික/ග්‍රාමීය බැංකු/සුපිරි වෙළඳසැල් ආදිය වසා දැමීමට හේතු වූ කරුණු සොයා බැලීමට යම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද?

(ii) ඒ කුමන ක්‍රියාමාර්ගයක්ද?

(iii) අනාවරණය කරගත් හේතු මොනවාද?

(iv) එම අනාවරණය කරගත් හේතු මත ගෙන ඇති පියවර කුමක්ද?

**(ආ).** ඉහත ප්‍රශ්න අංක අ) (i) හි සඳහන් එකී ආයතනයන් අතුරෙන් සමූපකාර ප්‍රඥප්තියට සහ රීතීන්ට අනුව විමර්ශනය සඳහා පරීක්ෂණ ආරම්භ කර ඇති ආයතන ගණන කීයද? ඒ මොනවාද?

**(ඇ).** (i) මෙම වර්ෂයේ නිරීක්ෂණයන් අනුව වසා දැමීමට යෝජිත, ප්‍රාදේශික/බැංකු/සුපිරි වෙළඳසැල් තිබේද? ඒ මොනවාද?

(ii) එම හඳුනාගත් ආයතන යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි නම් එසේ වීමට හේතු මොනවාද?

(iii) ඒ සඳහා වගකිව යුතු අය සම්බන්ධයෙන් ගෙන ඇති සහ ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මොනවාද?

(iv) එම හඳුනාගත් පුද්ගලයන්,නම් සහ තනතුරු වශයෙන් කවුරුන්ද?

**(ඈ).** (i) ඉහත වගකිව යුතු නිලධාරීන්/සේවකයන් සම්බන්ධයෙන් රටේ පොදු නීතිය අනුව කටයුතු කර තිබේද? ඒ කවුරුන් සම්බන්ධයෙන්ද?

(ii) එසේ ක්‍රියාකර නොමැති නම් එයට හේතු මොනවාද?

3. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/vi(1)/16/83)

අ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහබෙල්ලන තොටුපල මාර්ගයේ මාර්ගයට හා අසල තාප්පවලට හානිදායක අයුරින් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මඟින් පස් කැපීමක් සිදුකර ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ) එසේ නම් එම පස් ප්‍රාදේශීය සභාව කුමන කටයුතු සඳහා යෙදෙවුවේද?

ඇ) එම ක්‍රියාදාමයේදී අදාල මාර්ගයට හා තාප්ප වලට වී ඇති හානිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව මඟින් කිනම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද?

ඈ) නොඑසේ නම් මන්ද?

ඉ) එම මාර්ගයෙන් ලබා ගන්නා පස් අලෙවි කර තිබේද?

4. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/vi(1)/16/84)

අ) ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති විසින් අංක *WP/CB/G/ED/2015/3/15/13* හා *2015* නොවැම්බර් *03* දිනැතිව විගණන විමසුමක් සිදු කර තිබේද?

ආ) එසේ නම් එය කුමන කරුණු පදනම් කර ගනිමින්ද?

ඇ) එම විගණන විමසුමේ නිර්දේශ මොනවාද?

ඈ) පාසලක වසර 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ ගුරුවරුන් ස්ථාන මාරු කිරීමට එමගින් නිර්දේශ කර තිබේද?

ඉ) ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී එය ඇතැම් ගුරුවරුන්ට පමණක් සීමාවන පරිදි ක්‍රියාත්මක කර ඇති බවට තිබෙන තොරතුරු සත්‍යද?

ඊ) නොඑසේ නම් එම විගණන විමසුම් නිර්දේශ අදාළ සියලු ගුරුවරුන්ට ක්‍රියාත්මක කළේද?

5. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/vi(1)/16/85)

අ) ගම්පහ දිස්ත්‍රික්කයේ හේනෙගම මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසැලක් පවතින්නේද?

ආ) i. එම විද්‍යාලයේ වත්මන් විදුහල්පතිවරයාගේ නම කුමක්ද?

ii. එම තනතුරට පත්වීම සඳහා ඔහුට සුදුසුකම් ප්‍රමාණවත්ද?

ඇ) එම විද්‍යාලයේ 10 වන වසරේ පන්ති කොපමණ ප්‍රමාණයක් පවතින්නේද?

ඈ) එම 10 වන වසරේ එක් එක් පන්තිවල දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

6. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

**( ප්‍ර/vi(1)/16/86 )**

අ) බස්නාහිර පළාත තුළ ගුරු ස්ථාන මාරු සිදුවන්නේ "ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට" අනුවද?

ආ) එම ස්ථාන මාරු විධිමත්ව හා විනිවිදභාවයෙන් සිදුකරන බවට තහවුරු කරන්නේද?

ඇ) බස්නාහිර පළාත තුළ හා කලාප තුළ ගුරු ස්ථාන මාරුවීම් සිදුකිරීමේ බලතල පවරා ඇත්තේ කාටද?

ඈ) ඒ අනුව නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ට ස්ථානමාරු කිරීමේ බලතල හිමිවන්නේ කෙසේද?

ඉ) පිළියන්දල අධ්‍යාපන කලාපයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරිය තම බලතල අභිබවා ස්ථාන මාරුවීම් සිදුකරමින් ඇති බව ඔබ දන්නෙහිද?

ඊ) මෙබඳු ක්‍රියා සම්බන්ධයෙන් ඔබගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් මන්ත්‍රීතුමා :**

'බස්නාහිර පළාතේ පාරම්පරිකව ජීවත්වන ජනතාවගේ පාරම්පරික ඉඩම් පවුල් සාමාජිකයින් අතර පාරම්පරික උරුමය මත බෙදී යාමේදී එක් පුද්ගලයෙකුගේ ඉඩම් අයිතිය පර්චස් 4, 5 වැනි අගයන් දක්වා පහත වැටෙන අවස්ථා ඇත.

වර්තමානයේ පළාත් පාලන ආයතන බිම් කට්ටි සැලසුම් හා නිවාස සැලසුම් අනුමත කිරීමේදී ප්‍රාදේශීය සභා, අවම ඉඩම් වපසරිය පර්චස් 10 ලෙසත් මහ නගර සභා, හා නගර සභා, පර්චස් 6 ලෙසත් සලකා කටයුතු කිරීම සිදු කරයි.

ඒ හේතුවෙන් ඉහත දක්වන ලද පාරම්පරික ඉඩම් හිමියන්ට පර්චස් 5, 4 ඉඩම් කට්ටි සඳහා සැලසුම් අනුමත කර ගැනීමට ඇති ගැටළුව සලකා එම පාරම්පරික ඉඩම් හිමියන්ගේ නිවාස සැලසුම් හා බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේදී ඉඩමේ වපසරිය පර්චස් 04 ක අවමය වන සේ සලකා සැලසුම් අනුමත කළ යුතු යයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.'

**( යෝ/vi(1)/15/06)**

## X. සභාව කල් තැබීම

කේ.එච්.සී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.09.07 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.